(4) (a) සාරි හැට්ටය සඳහා මූලික පතොරොම් පිටුපස ඉන ආරය සකස්කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

(b) සාරි හැට්ටයේ කර නිම කරගන්නා ආකාරය විස්තර කරන්න.

(04) (1) නිඳන කාමරය සඳහා යෝග්‍ය බිම් සැලැස්මක් පරිමාණයට ඇඳ ගෘහ භාණ්ඩ තැන්පත් කරන අයුරු දක්වන්න.

(2) (a) විසිත්ත කාමරය සඳහා යෝග්‍ය තිර රෙදි මෝස්තර 02 ක් නම් කරන්න.

(b) ඔබ නම් කළ එක් මෝස්තරයක් රූප සටහන් ඇසුරින් දක්වන්න.

(3) (a) නිඳන කාමරයේ ඇඳ වැස්ම සඳහා පිරිසැකසුම සකස් කරන අයුරු පැහැදිලි කරන්න

(b) ඇඳ වැස්මේ අද්දර අලංකාර ලෙස නිම කිරීමේ ක්‍රම 02 ක් නම් කර එක් ක්‍රමයක් නිම කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

## II කොටස

- **පස්වන ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 03 කට පිළිතුරු සපයන්න.**

(05) 11 ශ්‍රේණියේ ඉගෙනුම ලබන විශ්වන්ත, ක්‍රියාශීලී, සමාජශීලී නායකත්වයක් ගෙන කටයුතු කළ හැකි එහෙත් දෙමාපියන්ගේ බසට ඇහුම්කන් නොදෙන දරුවෙකි.

(1) විශ්වන්තට පාසලට රැගෙන යාම සඳහා දිවා ආහාර වේලක් සැලසුම් කරන්න.

(2) විශ්වන්තගේ මව ඇගේ මවට ආහාර වේලක් සකස් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සඳහන් කරන්න.

(3) මෙම දරුවා පසු කරන අවධිය, විශේෂ වීමට හේතු පැහැදිලි කරන්න.

(4) විශ්වන්තගේ නොගැලපෙන හැසිරීම් රටා, අවම කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

(06) (1) පසු ළමාවියේ දරුවාගේ කායික වර්ධනය කෙරෙහි බලපාන සාධක 04 ක් දක්වන්න.

(2) පසු ළමාවියේ දරුවා පෙන්නුම් කරන හැකියාවන් 04 ක් දක්වා ඉන් 02 ක් විස්තර කරන්න.

(3) දරුවා තුළ තිබිය යුතු යහපත් සමාජමය හැසිරීම් රටා 04 ක් පැහැදිලි කරන්න.

(4) යෞවනයන් යොමු විය හැකි සමාජ විරෝධී ක්‍රියා 04 ක් නම් කරන්න.

(5) ඔබේ මිතුරෙකු එවැනි සමාජ විරෝධී ක්‍රියාවක නිරත වන්නේ නම් ඔබ කරන්නේ කුමක්ද ?

(07) යොවුන් වියේ පසුවන නුවන්තිකාගේ උපන් දිනය නිමිත්තෙන් පැමිණෙන යෙහෙළියන් වෙනුවෙන් සුළු කෑම වර්ග රාශියක් ඇගේ නිවසේ පිළියෙළ විය.

(1) ෂෝට් ක්‍රස්ට් පිටි මෝලිය හා පාන් පිටි මෝලියේ දැකිය හැකි වෙනස්කම් දක්වන්න.

(2) පාන් පිටි මෝලියේ පිසීමේ ක්‍රියාවලිය විස්තර කරන්න.

(3) ෂෝට් ක්‍රස්ට් පිටි මෝලිය භාවිතයෙන් සකස් කළ හැකි ආහාර වර්ග 02 ක් නම් කර ඉන් එක් වර්ගයක් සකස් කිරීමට අවශ්‍ය අමු ද්‍රව්‍ය ලැයිස්තුගත කරන්න.

(4) නුවන්තිකාගේ උපන්දින සාදයට ආහාර වට්ටෝරුවක් සැලසුම් කරන්න.

(08) පහත දක්වා ඇත්තේ දියවැඩියා රෝගයෙන් පෙළෙන අයකු සඳහා පිළියෙළ වූ රාත්‍රී ආහාර වට්ටෝරුවකි.

ඉඳි ආප්ප   තෝර මාළු කිරි හොදි   ඇඹරැල්ලා චට්නි   පලතුරු සළාද

(1) ඉහත සඳහන් ආහාර වට්ටෝරුව ඔහුට යෝග්‍ය, ආයෝග්‍ය බව පැහැදිලි කරන්න.

(2) මෙම වට්ටෝරුව දියවැඩියා රෝගියකුට යෝග්‍ය ලෙස නැවත සැළසුම් කරන්න.

(3) මෙම රෝගියා සඳහා තෝරා නොගත් හෝ අවම ගත යුතු ආහාර ලැයිස්තුවක් පිළියෙළ කරන්න.

(4) ''ගැස්ට්‍රයිටීස්'' ඇති වීමට හේතු විස්තර කරන්න.

(09) (1) මවගේ සහ බිළිඳාගේ සුහසිද්ධිය උදෙසා ගර්භණී මවකට ලබාදිය යුතු රැකවරණය හා උපදෙස් මොනවාද ? කරුණු 04 ක් දක්වන්න.

(2) ඩිම්බය හා ශුක්‍රාණුව අතර ඇති වෙනස්කම් කරුණු 04 ක් ඇසුරෙන් සන්සන්දනය කරන්න.

(3) ගර්භණී අවධියේදී මවට වැළඳෙන සමහර රෝග නිසා භ්‍රෑණයේ විකෘතිතා ඇති විය හැකිය. මෙසේ විකෘතිතා ඇතිවීමට හේතුවන රෝග 04 ක් ලියන්න.

(4) ඒඩ්ස් රෝගය වළක්වාලීම සඳහා යෞවනයන් දැනුවත් කිරීමට ඉදිරිපත් කළ හැකි කරුණු 04 ක් යෝජනා කරන්න.

(5) ළමා සෞඛ්‍ය වර්ධන සටහනේ තොරතුරු 02 ක් සඳහන් කර එය දරුවාගේ වර්ධනය දැන ගැනීමට ඉවහල් වන ආකාරය පැහැදිලි කරන්න.

www.artsapi.lk